*අවසාන කොටස (පසුගිය කලාපයෙන්)*

# වත්මන් අර්බුදයේ දුටු නුදුටු පැති

ටිල්වින් සිල්වා සහෝදරයා :- කෙටියෙන්ම පිළිතුරු දුන්නොත් ඔව්! ජනතා විමුක්ති පෙරමුණ සතුව ඒ හැකියාව තියෙනවා. ඒ විතරක් නෙවෙයි, මේ රට වෙනස් කිරීමේ හැකියාව තිබෙන්නේ දේශපාලන පක්ෂයක් ලෙස ගත්විට ජනතා විමුක්ති පෙරමුණට පමණයි කියලත් අපි කියනවා. ඒත් සමහරු සැක කරන්න පුළුවන් අපිට එය කළ හැකිද කියලා. එවැනි අයට අපි කියන්නේ අපේ භාවිතාව දිහා බලන්න කියලයි. මේ රටේ දේශපාලනය තුළ ජනතා විමුක්ති පෙරමුණේ අපි මොන තරම් ආදර්ශයන් දීලා තියෙනවද? මොන තරම් කැපකිරීම් කරලා තියෙනවද? අපේ රටට කැපකිරීමේ හා පරිත්‍යාග යේ ආදර්ශය දුන්නේ අපේ පක්ෂය විතරයි. රට වෙනුවෙන් තමන්ගේ දැනුම, හැකියාව, කාලය පමණක් නෙවෙයි අවශ්‍ය නම් ජීවිත පවා පරිත්‍යාග කළ හැකියි කියන එක භාවිතාවෙන් ඔප්පු කරපු එකම පක්ෂය අපියි. මේ වනවිටත් මේ රටට වෙන්න ගිය විශාල විනාශයන් රැසක් අපි වළක්වලා තියෙනවා. බෙදුම්වාදය පිළිබඳ ප්‍රශ්නයේදී 2002 පෙබරවාරි රනිල් - ප්‍රභා සටන් විරාම ගිවිසුම අත්සන් කරලා රට බෙදීමේ දිශාවට ගිය ගමන නවත්වන්න කටයුතු කළේ අපි නොවෙයිද? සන්ධානය හදලා, සන්ධානය දිනවලාසටන් විරාම ගිවිසුම අක්‍රිය කරලා අවසානයේ එය අහෝසි වන තැනට කටයුතු කළේ අපි. හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මිය ගෙනා සුනාමි සහන මණ්ඩලයට එරෙහිව ආණ්ඩුවෙන් එළියට බැහැල අධිකරණයට ගිහින් එය අහෝසි කළේ අපි. උතුරට ගැට ගහල තිබුණු නැගෙනහිර, අධිකරණය මගින් වෙන් කරලා දුන්නේ අපි.

ඒ වගේම ආර්ථික වශයෙන් මේ රට විකුණන්න හදනවිට බොහෝ දේවල් බේරගත්තේ අපි. ජල කලමනාකරණ පනත ගේන්න ඉඩ නොදී ජල සම්පත රැක්කේ අපි. කුඹුරු ටික, මහ පොළොව, වනාන්තර ටික විකිණීමට ඉඩනොදී ආරක්ෂා කළේ අපි. දුම්රිය අධිකාරි පනත අහෝසි කරවලා දුම්රිය දෙපාර්තමේන්තුව විකිණීම වැළැක්වුවේ අපි. විදුලි බල මණ්ඩලය කෑලිවලට කඩලා විකිණීම නැවැත්තුවේ හා තවමත් නවත්වාගෙන ඉන්නෙ අපි. තෙල් සංස්ථාවේ රජයට අයිති කොටස් ටික විකිණීමට ඉඩනොදී රැකගත්තේ අපි. ඒ අනුව මේ රට බෙදෙන්නෙ නැතිව, විකිණෙන්නේ නැතිව මේ මට්ටමෙන් තිබෙනවා නම් ඒ අපේ මැදිහත්වීම නිසයි.

ඒ වගේම අපි රටට දිනාදුන් දේවල් කොපමණද? 2001 පරිවාස ආණ්ඩුවෙන් ගොවි ජනයාගේ ණය කපා හැර ඔවුන්ව ණය බරින් මුදාගත්තා. අපි ඇමතිකම් ගන්නවා වෙනුවටචන්ද්‍රිකා මහත්මියගේ ඇමති මණ්ඩලය මණ්ඩලය 20ට අඩු කෙරෙව්වා. ඒ වගේම ස්වාධීන කොමිෂන් සභා සහිත 17 වැනි ආණ්ඩු ක්‍රම සංශෝධනය සම්මත ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිතියයි. අදත් ගාල්ලේ තිබෙන
බස් නැවතුම්පල ආණ්ඩුවේ මුදල් නොගෙන ඉදිකර දුන්නේ, හිතවතුන්ගේ උදව් සහිතව ජනතා විමුක්ති පෙරමුණයි.

ඒ වගේම වැටුප් නොගෙන සේවය කරන මහජන නියෝජිතයන් නිර්මාණය කළේ, ජනතා විමුක්ති පෙරමුණයි. මන්ත්‍රී වැටුප් පොදු අරමුදලකට

## ඉදිරි වැඩපිළිවෙළ

කර දුන්නා. ඉන්පසු සන්ධාන ආණ්ඩුව තුළ ඇමති තුනතුරු 04ක් දරමින් නව ආදර්ශ රැසක් දුන්නා. වැව් දස දහසේ ව්‍යාපෘතිය, කිරි ගොවි ගම්මාන, පොහොර සහනය නැවත ලබාදීම වැනි කටයුතු කළා. කුඩා කර්මාන්ත, ධීවර කර්මාන්ත නගාසිටුවීමට වැඩ කළා. සංස්කෘතික ක්ෂේත්‍රයේ බොහෝ දේ කළා. අනික් අතට සන්ධාන ආණ්ඩුව 40,000ක් උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නේ අපේ මැදිහත්වීම නිසා. ආණ්ඩුව ඇතුළෙ වැඩ කළා වගේම අපි ආණ්ඩු බලය නැතිවත් ස්වේච්ඡාවෙන් බොහෝ දේ කරලා තියෙනවා. සුනාමියෙන් විපතට පත් ජනයාට පිහිටවීම එක උදාහරණයක් විතරයි. මහජන මුදල් නාස්ති නොකර ස්වේච්ඡා ශ්‍රමයෙන් ජනතා සේවා ඉටු කිරීමට අපි බොහෝ දේ කරලා තියෙනවා. සුනාමියෙන් විනාශ වුණු මුහුදුබඩ දුම්රිය මාර්ගය දින 57කින් හදලා විප්ලවයක් කිරීමට මුල් වුණේ දුම්රිය දෙපාර්තමේන්තුවේ එක්කර ඉන් අපි ජනතා සුබ සාධන කටයුතු රැසක් කළා. තවමත් කරනවා. දැනට අනුරාධපුරය, කුරුණෑගල, මාතර, තිස්සමහාරාමය හා බදුල්ලේ පවත්වාගෙන යන දරුවන්ට නොමිලේ පරිගණක පුහුණුව ලබාදෙන පරිගණක පුහුණු මධ්‍යස්ථාන 05 ඊට එක් නිදසුනක් පමණයි. ඒ වගේම පක්ෂ විනය, සදාචාරය වැනි කරුණුවලදීත් අපි බොහෝ ආදර්ශයන් දීලා තියෙනවා. ඒ නිසා භාවිතාවෙන් මෙවැනි ආදර්ශ ලබාදීපු, කැප කිරීම් කරපු, හැකියාවන් පෙන්වපු වෙනත් පක්ෂයක් ලංකාවේ නැහැ. අපේ රටේ ජනතාව ජනතා විමුක්ති පෙරමුණට ගරු කරන්නේ ඒ නිසයි. ඒ නිසා මේ රටත්, ජනතාවත් ඉදිරිපිට තිබෙන අභියෝග ජයගැනීමට සමත් එකම පක්ෂය අපේ පක්ෂය බව අපි නොබියව ප්‍රකාශ කරනවා.

ප්‍රශ්නය :- අවසාන වශයෙන් ඔබ ශ්‍රී ලාංකීය ජනතාවට දෙන පණිවුඩය කුමක්ද?

සෝමවංශ අමරසිංහ සහෝදරයා :- අපේ රට, අපේ ආදරණීය මාතෘ භූමිය බරපතල සමාජ,ආර්ථික, දේශපාලන අර්බුදයක පවතින බව අපි කවුරුත් දන්නවා. අපේ රට ආර්ථික වශයෙන් පවතින්නෙ අගාධයක. දේශපාලන වශයෙන් අපේ රට පරාධීන වෙලා. සංස්කෘතික වශයෙන් පිරිහිලා. මෙය වෙනස් කළ යුතුයි. වෙනස් කළ හැකියි. ඒ සඳහා ඊට හේතු වූ සැබෑ කරුණු තේරුම් ගත යුතුයි. අපි පවත්නා මානසික වහල්භාවයෙන් මිදිය යුතුයි.
ඊනියා නිදහසින් පසු වසර 60ක් තිස්සේ සිදු වූ තට්ටු මාරු දේශපාලනයට නැවතීමේ තිත තැබිය යුතුයි. සැබෑ ජාතික නිදහස හරහා නිදහස් ජාතියක් ලෙස අභිමානයෙන් අපි නැගී සිටිය යුතුයි. සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනගා දුගී දුප්පත්කම තුරන් කළ යුතුයි. සමාජීය හා සංස්කෘතික වශයෙන් වඩාත් උසස් තත්වයට මේ රට පත් කළ යුතුයි.

ඉතා වටිනා ස්වභාවික සම්පත් රැසකින් පොහොසත් අපේ රට, ඉතාම දියුණු හා දක්ෂමානවසම්පතක් හිමි අපේ රට මෙසේ දුප්පත්ව තිබිය යුතු නැහැ. ඉපැරණි සංස්කෘතියකට, ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන අපේ ජනතාව මෙසේ දීනභාවයට, වහල්භාවයට පත්විය යුතු නැහැ. අපි අපේ රට යළිත් අත්පත් කරගෙන එය ඉහළට රැගෙන යා යුතුයි. ඒ සඳහා ජාතික නිදහස් අරගලය ඔස්සේ සමාජ පරිවර්තනයක අවශ්‍යතාවය අප ඉදිරියේ තිබෙනවා.

දැන් අපේ ජනතාවගේ වගකීම වන්නේ, එයට මැදිහත්වීමයි. ඒ නිසා මේ රටට දිනන, රට රකින, රට හදන සැබෑ දේශප්‍රේමී ආණ්ඩුවක් සඳහා අප ගොඩනගමින් සිටින නව ජාතික පෙරමුණ හා එක්ව එහි සක්‍රීය කොටස්කරුවකු වන ලෙසත්, මව්බිම දිනවීමේ අරගලයට එක්වන ලෙසත්, එහිදී සතුරු බලවේගයන්ගේ කුමන්ත්‍රණවලට, අවලාදවලට නොරැවටෙන ලෙසත්අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

*(සමාප්තයි)*

***ජනතා විමුක්ති පෙරමුණ,***
***ජාත්‍යන්තර අංශය, ඕස්ට්‍රේලියාව***

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia
ONSHORE
• Graduate skilled visa
• Student visa renewal
• Change visa subclass
• Family sponsored visa
• Skills assessments
• Change course provider
• Partner visa
• MRT (Review application)
OFFSHORE
• Skilled visa
• Student visa
• Visit visa
• In house IELTS
• Business visa
• Spouse visa
• Parent visa
• Appeals
Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms
Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986
Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696